# රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
# அரச கணக்குகள் திணைக்களம்
# Department of State Accounts

මගේ අංකය / எனது இல. / My No. SA/MA/MA/CIRCULAR
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2019.04. 30


**චක්‍රලේඛ ලිපිය : 01/2019**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>වාර්ෂික අයවැය ප්‍රතිපාදන කාර්තු පදනමින් සැලසුම්කිරීම හා ක්‍රියාත්මක කිරීම</u>**

උක්ත මැයෙන් නිකුත්කරන ලද රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 263/2017 කෙරෙහි ඔබගේ අවධානය යොමුකරමි.

එම චක්‍රලේඛ උපදෙස් අනුව, 2017 අංක 30 දරණ විසර්ජන පනත මගින් 2018 වර්ෂය සඳහා වෙන් කරන ලද අයවැය ප්‍රතිපාදන විධිමත් පරිදි උපයෝජනය කිරීම වෙනුවෙන් කාර්තු පදනමින් එම අයවැය ප්‍රතිපාදන බෙදාහැරීමටත් හා ඒ සඳහා අවශ්‍ය අක්මුදල් නිදහස් කිරීමත් සිදුකරන ලදී.

මෙහිදී ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් අනුමත කරනු ලබන කාර්තුමය ප්‍රතිපාදන සීමාවන්ට යටත්ව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අක්මුදල් සීමාවන් පනවන ලදී.

2018 වර්ෂය සඳහා චක්‍රලේඛ විධිවිධාන ඒ ආකාරයට ක්‍රියාත්මක කළ හැකි වුවද 2019 වර්ෂයේ මුල් මාස 4 සඳහා අතුරු සම්මත ගිණුමක් ක්‍රියාත්මක කිරීමට සිදුවීමත්, අපේක්ෂා නොකළ මට්ටමේ බැරකම් ප්‍රමාණයක් 2018 වර්ෂයෙන් ඉදිරියට ගෙන ඒමත් හේතුවෙන් ස්වයං පාලන අන්තර්කාලීන විධිවිධානයක් ලෙස 2019 වර්ෂය සඳහා කාර්තුමය අයවැය ප්‍රතිපාදන හා අක්මුදල් සීමාවන් පැනවීමේ/තීරණය කිරීමේ බලය එක් එක් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ප්‍රධාන මූල්‍ය නිලධාරී හෝ ප්‍රධාන ගණකාධිකාරී වෙත පවරාදීමට තීරණය කරන ලදී.

ඒ අනුව, 2019 වර්ෂය සඳහා වන කාර්තුමය අයවැය හා අක්මුදල් සීමාවන් සඳහා වන අනුමැතිය ජාතික අයවැය හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවලට ඉදිරිපත් නොකළ යුතු අතර ප්‍රධාන මූල්‍ය නිලධාරී හෝ ප්‍රධාන ගණකාධිකාරී තම අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල වාර්ෂික අනුමත ප්‍රතිපාදන සැළකිල්ලට ගෙන කාර්තුමය සීමාවන් තීරණය කර ඒ අනුව අදාළ වියදම් ඒකකවලට අවශ්‍ය ප්‍රතිපාදන හා අක්මුදල් සීමාවන් සලසාදිය යුතු ය.

මෙම නව ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි නව සිගාස් වැඩසටහන ද සංශෝධනය කර ඇති අතර එය සිගාස් සංකරණ අංක 5.2.2.0 යටතේ බාගත (Download) කිරීම මගින් ක්‍රියාත්මක කළ හැක.

කේ.ඩී.ආර්. ඕල්ගා

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

01. විගණකාධිපති
02. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අයවැය දෙපාර්තමේන්තුව
03. අධ්‍යක්ෂ ජනරාල් - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව


මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව. பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka.
General - Tel.: +94 11 2484500/600 Ext.: 1149 Fax : +94 11 2484869 Website : www.sad.gov.lk
Director General - Tel.: +94 11 2484728 Fax : +94 11 2473856 e -mail : dgsa@sad.treasury.gov.lk